**ශීර්ෂය 112 - විදේශ අමාත්‍යාංශය**

**--------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

විදේශ අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විදේශ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අක් මුදල් ගැලපුම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම ප්‍රකාරව අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු. 220,670,748 ක් වුවද එය රු. 223,313,053 ක් ලෙස අක්මුදල් ගැලපුම් ගිණුමට ගැලපීම හේතුවෙන් රු. 2,642,305 ක් වැඩියෙන් එම ගිණුමට ගැලපුම් කර තිබුණි. | විගණන වාර්තාවේ දක්වා ඇත්තේ වෙනත් වැය ගිණුම් සඳහා කරන ලද වියදම් වන රු. 220,670,748 ක මුදලය. එහෙත් ඊට අමතරව මෙම අමාත්‍යාංශයට අලුතින් ස්ථාපනය කර තිබූ රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ අත්තිකාරම් බී ගිණුම යටතේ වන වියදම සඳහාද මෙම අමාත්‍යාංශයේ මුදල් ගිණුම හරහා ගෙවීම් සිදු කළ හැකි බැවින් එම අමාත්‍යාංශයේ අත්තිකාරම් ගෙවීම් සිදු කළ රු. 2,607,081 ක මුදල හා වැය ගිණුම් අංක 155 යටතේ අත්තිකාරම් ගෙවීමක් සිදු කර ඇති රු. 35,223.18 ක මුදලද ඇතුළත් වේ. ඒ අනුව අක් මුදල් ගැලපුම් ගිණුමට ගෙන ඇති රු. 223,313,053 වෙනත් වැය ගිණුම් වෙනුවෙන් ගෙවීම් කර ඇති වියදම බව පෙන්වා දෙමි. | 2020 නොවැම්බර් 20 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2020 අනුව නව වැය විෂයයන් සඳහා දරන ලද වියදම් ජ'නල් මාරු කිරීම් මඟින් නව වැය විෂයයට හර කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්තිකාරම් බී ගිණුමට අදාළව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ ලැබීම් වටිනාකම හා ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ලැබීම් වටිනාකම අතර වෙනස රු. 20,151,655 ක් වුවද අක්මුදල් ගැලපුම් ගිණුමට රු. 10,211,026 ක් පමණක් ගැලපුම් කර තිබුණි. | අත්තිකාරම් බී ගිණුමට අදාළ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ සඳහන් මුදල වන රු. 10,211,026 ක මුදල නිවැරදි වන අතර ඒ සඳහා ගිණුම්ගත කොට අත්තිකාරම් බී ගිණුම සකස් කොට ඇත. මෙම මුදල සිගාස් වැඩසටහනට ඇතුළත් නොකරන ලද අතර ණයගැති ලේඛනයේ (CC10) ඉවත් කොට ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් බී ගිණුමට අදාළ ගෙවීම් වටිනාකම හා ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ගෙවීම් වටිනාකම අතර වෙනස රු. 2,701,974 ක් වුවද අක්මුදල් ගැලපුම් ගිණුමට රු. 24,061,814 ක් ලෙස ගැලපුම් කර තිබුණි. | අත්තිකාරම් බී ගිණුමට අදාළ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ සඳහන් මුදල වන රු. 24,061,814 ක මුදල නිවැරදි වන අතර එම මුදල ගිණුම් ගත කොට ණයගැති ලේඛනයට (CC10) ඇතුළත් කොට අවසාන ගිණුම් පිළියෙළ කර ඇත. | -එම- |
| (ඈ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන ප්‍රකාරව තැන්පතු ලැබීම්වල රු. 35,164 ක වෙනසක් පැවතියද අක්මුදල් ගැලපුම් ගිණුමට මෙම වෙනස ගැලපුම් කර නොතිබුණි. | ගිණුම් පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශ 06 හි 07 (VI) අනුව අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කර ඇත. ඉහත සඳහන් පරිදි ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල වෙනසක් ගැලපීම අවශ්‍ය වේ යැයි උපදෙස් ලබා දී නොමැත. | -එම- |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ අපහරණය කර තිබූ වාහන 13 ක් අතරින් වාහන 07 ක පිරිවැය වූ රු. 42,025,801 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දක්වා තිබූ වාහන ශේෂයෙන් ඉවත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ වාහන පිරිවැය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අපහරණය කරන ලද වාහන **07** හි පිරිවැය වටිනාකම් වන රු. 42,025,801 ක අගය 2020 වර්ෂයේ ගිණුම් මගින් වැරදීමකින් ඉවත් නොකරන ලද බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ අගය රු. 42,025,801 ක් වැඩියෙන් දැක්වේ. එම අපහරණය කරන ලද වාහන 2021 වර්ෂයේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී ඉවත් කිරීමට කටයුතු කරමි. | අපහරණය කරන ලද වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් රු. 3,060,448,277 ක් වුවත් විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව එම වටිනාකම රු. 3,059,530,503 ක් විය. ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් රු. 917,774 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි වශයෙන් අදහස් දක්වා ඇත. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් ලැබීම් නිවැරදිව සටහන් කළ යුතු වීම. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| (i) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම් මුදල් ප්‍රවාහය රු. 2,389,880,478 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 115,868,505 ක් ලෙස දක්වා තිබුණි. තවද ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමේ ඇතුළත් නොවූ වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් රු. 2,168,408,321 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | 2020/06/12 දින ඔබ විසින් ලබා දී ඇති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.2.1 යටතේ දක්වා ඇත්තේ පසුගිය වසරේ අප විසින් මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල නොකර ඇති බවයි. එබැවින් ඔබ දෙපාර්තුමේන්තුව පෙන්වා දුන් අඩුපාඩුව නිවැරදි කරමින් මෙම වර්ෂයේ මුදල් පදනම මත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල බවද ඔබේ අවධානයට යොමු කරමි. | 2020 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමින් සකස් කළ යුතු බව අවධාරණය කර තිබීම හේතුවෙන් එම පදනම අනුගමනය කළ යුතු වීම. |
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු. 10,061,370,232 ක් වූවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 9,422,254,088 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 639,116,144 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (iii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු. 183,126,849 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 220,670,748 ක් වූයෙන් වෙනස රු. 37,543,899 ක් විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**<br>--------------------------------- | | |
| (i) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 63,627,057 ක් වූවද එම වටිනාකම රු 2,040,238 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබුණු බැවින් රු. 61,586,819 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි. | -එම- | -එම- |
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 49,605,057 ක් වූවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු. 65,309,682 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 15,704,625 ක් අත්තිකාරම් ගෙවීම් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (iii) | ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ වත්කම් මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු. 185,502,310 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත් කරගැනීම් රු.70,399,077 ක් පමණක් විය. | -එම- | -එම- |
| (ඇ) | **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**<br>--------------------------------- | | |
| (i) | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු. 1,330,409,586 ක් තැන්පතු ලැබීම් ලෙස දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 1,452,471,015 ක් වූයෙන් වෙනස රු. 122,061,429 ක් විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ තැන්පතු ගෙවීම් ලෙස රු. 1,304,509,579 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 1,595,777,211 ක් විය. ඒ අනුව රු. 291,267,632 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

## 1.6.5 අග්‍රිම ශේෂය

---------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් දෙකෙහි ශේෂය රු. 825,645,104 ක් වුවද භාණ්ඩාගාර පරිගණක පොත් අනුව එම ශේෂය රු. 879,242,556 ක් වූ බැවින් රු. 53,597,452 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද 2013 වර්ෂය හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට අදාළ අග්‍රිම ගිණුමේ ශේෂයෙහි නොපියවූ අත්තිකාරම් රු. 91,530,099 ක් ඇතුළත්ව තිබුණි. | රු 53,597,452 ක වෙනසට හේතු වන්නේ අමාත්‍යාංශය විසින් විදේශ දූත මණ්ඩල සඳහා දෙසැම්බර් මාසය තුල යවන ලද අක් මුදල් රු මි. 50 ක් බැංකු ප්‍රමාදයන් නිසා විදේශ දූත මණ්ඩල වෙත යාම සඳහා ප්‍රමාද වීම හේතුවෙන් එම මුදල් මාර්ගස්ථව තිබීම හා ඉතිරි රු. 3,639,319.79 අක්මුදල් නිදහස් කිරීමේදී සිදු වූ ලාබ පාඩු ගැලපුම හා දෙසැම්බර් මාසය අවසානයේ විදේශ දූත මණ්ඩල මගින් සිදු කරන ලද අත්තිකාරම් ගැලපුම වේ. | භාණ්ඩාගාර පරිගණක පොත් අනුව සහ අමාත්‍යාංශ පොත් අනුව අග්‍රිම ශේෂය සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට සකස් කර ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| **(ආ) හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මු.රෙ. 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය දැනට පවත්වාගෙන යනු ලබන අතර එය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

## 1.6.7 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විදේශ දූත මණ්ඩල 67 කින් දූත මණ්ඩල 09 කට අදාළව රු. 9,135,600,970 ක් වූ පුනරාවර්තන වියදම් හා රු. 158,312,300 ක් වූ මූලධන වියදම පරීක්ෂා කිරීමට අදාළ ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දූත මන්ඩලවලින් නියමිත වේලාවට ගෙවීම් වවුචරපත් එවීම ප්‍රමාදවීම පිළිබඳව සියළුම දූත මණ්ඩල දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. | සියලුම ගෙවීම් වවුචර් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඪකා දූත මණ්ඩල කාර්යාලය අංක 1804000073 දරන බැංකු ගිණුම සඳහා ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයේ ටකා 2,101,250 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 04 වටිනාකම් තහවුරු කෙරෙන උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් උපලබ්ධි නොවූ චෙක්පත් 4 සම්බන්ධයෙන් උපලේඛනයක් ඉදිරිපත් කරන ලෙස දූත මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. | වටිනාකම් තහවුරු කරන උපලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | අංක 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුම යටතේ අමාත්‍යාංශය අවස්ථා 179 කදී ලබා දෙන ලද රු. 39,550,728 ක් වූ අත්තිකාරම් කුමන කරුණක් සඳහා ලබා දී තිබේද යන්න හඳුනාගෙන නොතිබුණි. | 7002-0-2-35/13 අග්‍රිම ගිණුමෙහි මේවන විට සඳහන් සියලුම ශේෂයන් විදේශ දූත මණ්ඩල වෙතින් විමසා නිසි පරිදි හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී. | කුමන කරුණක් සඳහා අත්තිකාරම් ලබා දුන්නේද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුම** | | |
| **(i)** | සමාලෝචිත වර්ෂය අවසන් දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 91,530,099 ක් වූ අතර, එය 2013 වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට අදාළ නොපියවූ අත්තිකාරම් වලින් සකස් වී තිබුණි. එම අත්තිකාරම් වලින් රු. 51,979,371 ක් විදේශ දූත මණ්ඩල සේවය | 7002-0-0-35/13 දරන අග්‍රිම ගිණුමෙහි සඳහන් අත්තිකාරම් පෙර වර්ෂයන් හිදි මිලියන **100** ඉක්මවා තිබුණද අප අමාත්‍යාංශය විසින් එම අත්තිකාරම් නැවත අයකර ගැනිමට කටයුතු කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 7002-0-2-35/13 දරන අග්‍රිම ගිණුමෙහි දැනට රු 91**,530,099** ඉතිරිව ඇත. තවද පෙර වර්ෂයන්හි පවත්නා මෙම | නොපියවූ අත්තිකාරම් කඩිනමින් අය කර ගැනීමට හෝ විධිමත් අනුමැතියකින් කපා හැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 173 කින් සමන්විත වී තිබුණි. එම වටිනාකමින් රු. 4,285,061 ක් වර්ෂ 20 ඉක්මවා තිබුණු අතර, රු. 44,284,956 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20 ක කාල පරාසයක් තුලද, ඉතිරි තැන්පතු ශේෂය රු. 3,409,354 ක් වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. | නොපියවූ අත්තිකාරම් අයකර ගැනීමට හෝ නිසි ක්‍රමවේදයකට අනුව කපාහැරීමට නියමිත ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ක්‍රියාකරනු ලැබේ. | |
| **(ii)** | නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 173 න් තැන්පතු 165 කට අදාළ රු. 47,954,750 ක් මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වී තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 250 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නිවෙස් සඳහා තබා ඇති ආරක්ෂණ තැන්පතු **අයකර ගැනිම සඳහා** අමාත්‍යාංශය විසින් විදේශ දූත මණ්ඩල වෙත වරින් වර අභ්‍යන්තර චක්‍රලේඛන නිකුත්කරන ලදී. තවද එම තැන්පතු අයකර ගැනීම සඳහා විදේශ දූත මණ්ඩලයන්ගෙන් විමසීම් කර අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදී.ඒ අනුව එම තැන්පතු නැවත අයකර ගැනීම සඳහා ඉදිරියේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අමාත්‍යාංශය විසින් ක්‍රියා කරනු ලැබේ. | විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | **7002-0-0-035/20** දරන **අග්‍රිම ගිණුම** | | |
| **(i)** | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අග්‍රිම ගිණුම් ශේෂය තුළ නොපියවූ අත්තිකාරම් රු. 355,085,724 ක් වූ අතර එම වටිනාකම තුළ | දැනට පදිංචි වී නොමැති නිවෙස් සඳහා තබා ඇති ආරක්ෂණ තැන්පතු නැවත අයකර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් විදේශ දූත මණ්ඩල වෙත වරින් වර අභ්‍යන්තර චක්‍රලේඛන යවා එම | විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු. 20,464,959 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු. 49,112,123 ක් වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක වටිනාකම් වී තිබුණි. තවද මෙම ආරක්ෂිත තැන්පතු වලින් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 56 ක වටිනාකම රු. 21,275,938 ක් විය. | ආරක්ෂණ තැන්පතු අයකර ගැනීමට පවත්නා අපහසුතාවයන් විමසීම් කරන ලදී. ඒ සඳහා අවශ්‍ය නිසි තොරතුරු මේ වන විට එක්රැස් කරමින් පවතින බැවින් ඉදිරියේදී මේ සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කරනු ලැබේ. | පිළියෙල කළ යුතු වීම. |
| **(ii)** | දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් රු. 23,293,715 ක් තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර, එම අත්තිකාරම් තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. 9,168,655 ක් ද 2018 වර්ෂයට අදාළ රු. 813,741 ක් හා 2019 වර්ෂයට අදාළ රු. 3,912,255 ක් ද විය. ඒ අනුව මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිමකළ වහාම පියවිය යුතු නමුත් එම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් මුදල් හැකි ඉක්මනින් පියවීමට අදාල දූත මණ්ඩල දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. අමාත්‍යාංශය විසින් ඉදිරියේදී එවැනි තත්කාර්යය අතුරු අග්‍රිම නිසි පරිදි එම කාර්යයන් අවසානයේ අයකර ගැනීමට කටයුතු කිරීමට අදාල විදේශ දූත මණ්ඩල වෙත චක්‍ර ලේඛන මගින් උපදෙස් ලබාදීමට දැනටමත් කටයුතු කර ඇත. | කාර්යය නිම කළ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**
---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 **(II)** ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට | ඇස්තමේන්තු සකස් කිරීම මු.රෙ. 50**(ii)** ට අනුව සම්පූර්ණවත්**,** නිවැරදිවත් | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව |

| | | |
|---|---|---|
| සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 18 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු. 141,180,009 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | පිළියෙල කර ඇතත්, විගණන විමසුමේ පෙන්වා ඇති වැය විෂයයන් 18 ක ඒ ඒ වැය විෂයයේ ප්‍රතිපාදන මුදලින් 51% සිට 100% ක් දක්වා පරාසයකින් මුළු වටිනාකම රු. 141,180,009/- ක ප්‍රතිපාදන ඌන උපයෝජනය සිදු වී ඇති බවට එකඟ වෙමි. | පිළියෙල කළ යුතු වීම. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි විගණන පරික්ෂාවේදී 2020 වර්ෂයේ වියදම් ලෙස ගෙවීම් කර තිබූ රු. 1,553,856 ක බැරකම් විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී බැරකම් හා බැදීම් වලට අදාල ආකෘතිය පරිදි අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩල වලින් බැරකම් සහ බැදීම් වලට අදාල තොරතුරු ලබා ගැනීම සිදු කරයි. එම තොරතුරු පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශනයට බැරකම් ඇතුළත් කරයි. නමුත් තොරතුරු සැපයීමේදී වන ප්‍රමාදදෝෂ නිසා සමහර බැරකම් විස්තර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් වී නොමැත. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩලවල අදාල සියළුම නිලධාරීන් දැනුවත් කිරීමටත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාදදෝෂයන් ඇති නොවීමට කටයුතු කිරීමටත් සටහන් කරගන්නා ලද බව කාරුණිකව දන්වමි. | සමාලෝචිත වර්ෂයට අදාළ සියලු බැරකම් විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

-----------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. ඒ අනුව ඉදිරියේදී අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සමාලෝචනය ලිඛිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 4.4, 4.5 හා 4.6 වගන්තීන් | ලබාගත් ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අයවිය යුතු සියලුම මුදල් විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද, මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති රු.465,050 ක ශේෂය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂයෙන් රු. 408,750 ක් වර්ෂ 5 ට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. | මෙම ණය ශේෂ අය කිරීමට අදාළව විශ්‍රාම ගොනු මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කිරීමට දන්වා ඇත. එහෙත් මෙතෙක් විශ්‍රාම ගොනු අනුමත වී නොමැතිවීම නිසා ණය ශේෂ නිරවුල් නොවී පවතී. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| **i. මුදල් රෙගුලාසි 104** | වර්ෂ 01 ක සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු රු. 3,990,669 ක් වූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් හා 2010 වර්ෂයේදී සිදුව තිබූ රු. 1,991,695 ක් වූ වාහන සොරකම් කිරීම් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විදේශ තානාපති කාර්යාලවල සිදුවන හානි පාඩු සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර ඒ අනුව ඉදිරියේදී වාහන අනතුරුවලින් සිදුවන හානි පාඩු අය කර ගැනීමට / පොතෙන් කපා හැරීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **ii. මුදල් රෙගුලාසි 106** | ඌනතාවයක්, අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා මුදල් නැතිවූ විටක ඒ නැති වූ මුදල වහාම පූරණය කල යුතු වුවත් විදේශ දූත මණ්ඩල 3 කට අදාළව රු.1,017,626 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රෝම තානාපති කාර්යාලයේ සිදුව ඇති රු. 16,141,919 ක අදාල මුදල් සොරකම පිළිබඳ කොළඹ මහාධිකරණයේ නඩු 02ක් පවරා ඇති අතර දැනට ඒවා විභාග වෙමින් පවතී. අනෙකුත් හානි සම්බන්ධයෙන් අදාල තොරතුරු විදේශ දූත මණ්ඩලවලින් ලබාගෙන අවශ්‍ය කටයුතු කඩිනම් කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි 106 ප්‍රකාරව නැති වූ මුදල් වහාම පූර්ණය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| iii. | **මුදල් රෙගුලාසි 565(5)** | එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව එක් එක් මාසය සඳහා මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපති වෙත යැවිය යුතු වීම. |
| iv. | **මුදල් රෙගුලාසි 571** | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් ඉක්ම වූ හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත්, අමාත්‍යාංශය විසින් රු.16,787,484 ක තැන්පතු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **2015 ඔක්තෝම්බර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 4.3 (ඉ) (i) හා (ii)** | චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,098,606 ක ණය ශේෂ එපරිදි අයකර නොතිබුණු අතර ඉන් රු. 666,963 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | මෙහි සඳහන් චක්‍රලේඛ ප්‍රකාරව අය කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ගෙන්වා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ අතර, එමගින් අදාළ පුද්ගලයන් සොයා ගැනීමට නොහැකි විය. තවදුරටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කල් ඉකුත් වූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) **2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ -** | අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවසන් වූ විගස විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතු වීම. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | --------------------- |
| (අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ලබා දී ඇති ණය මුදලින් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 1,499,175 ක් වූ හඳුනා නොගත් ණය ශේෂයක් පැවතුණි. | මෙම ණය ශේෂයන් කාලයක සිට පැවත එන ණය ශේෂ වන අතර, හිඟ ශේෂ වලට අදාල නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා මැතිවරණ දෙපාර්තමේන්තුවට දැනුම් දී අනන්‍යතාවයන් සොයා ගැනීම සඳහා කටයුතු කළ ද, ප්‍රමාණවත් තොරතුරු අනාවරණය නොවීය. මේ අනුව තෙරතුරු සොයා ගැනීමට අපහසු බැවින් භාණ්ඩාගාරය වෙත දන්වා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්තිකාරම් බී ගිණුම අනුව නිලධාරින් 16 දෙනෙකුගෙන් රු. 200,129 ක් වර්ෂ 1ක සිට වර්ෂ 3 ක් අතර කාල පරාසයක සිට වැඩිපුර අයකර ගෙන තිබුණද එම ශේෂයන් 2021 මාර්තු 20 වන දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ අත්තිකාරම් **"B"** ගිණුමට වැඩිපුර අයවීම් ලෙස දක්වා තිබෙන රු.200,019 ක මුදල විනිමය අනුපාත වෙනස්වීම් මත වැඩිපුර ලැබී ඇති මුදලක් වන අතර, ඒ තුළින් දැනටමත් නිලධාරීන් කිහිපදෙනෙකුගේ මුදල් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. අනෙක් නිලධාරීන් නැවත සියරට පැමිණි පසු නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව වරින් වර එම මුදල් ඔවුන් වෙත ලබාදීමට කටයුතු යොදා ඇත. | වැඩිපුර අය කර ගන්නා ලද ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් ලද 2020 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව එක් එක් තැන්පතු ගිණුම් අංක යටතේ භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව ආරම්භක ශේෂයන් අතර රු. 4,521,094 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට පියවර ගනිමි. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව වෙනසක් නොපැවතිය යුතු වීම. |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ වටිනාකම රු.1,132,582 ක් වූ චෙක්පත් 40 ක් හා විදේශ දූත මණ්ඩල 07 ක චෙක්පත් 89 ක් 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) පරිදි කටයුතු කර නොතිබුණි. | දූත මණ්ඩලවල බැංකු ගිණුම් පවත්වාගෙන යාමට අදාලව (අ) සිට (ඉ) දක්වා ඡේදවලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඒ ඒ දූත මණ්ඩල දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) | අමාත්‍යාංශයේ රු. 612,729 ක් වූ චෙක්පත් 02 ක් හා විදේශ දූත මණ්ඩල 03 ක චෙක්පත් 12 ක් හඳුනා නොගත් හර වශයෙන්ද, ක්වාලලම්පූර් දූත මණ්ඩලයෙහි චෙක්පත් 04 ක් හඳුනා නොගත් බැර ලෙසද පැවතුණි. | -එම- | හඳුනා නොගත් හර හා බැර ශේෂ හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ලොස්ඇන්ජලිස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ. ඩො 1583 ක් ද මොස්කව් දූත මණ්ඩලයෙහි 2002 වර්ෂයේදී හා 2003 වර්ෂයන්හීදී තැන්පත් නොකරන ලද මුදල් ලෙස ඇ.ඩො 155 ක් ද බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පැවතියද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | සොරකම් කරන ලද හා තැන්පත් නොකරන ලද මුදල් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන්, ඉටු නොකළ ක්‍රියාකාරකම්, ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්, අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිලාභ මට්ටම් ලබා නොගැනිම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇත. එහි ඇති කාර්යභාරයන් පිළිබඳව ප්‍රගතිය දැක්වෙන වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කිරීමට පියවර ගනිමි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම්වල ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වූවත් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව දැනට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර ඇති අතර සිංහල භාෂාවට හා දමිළ භාෂාවට පරිවර්තනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>ඒ අනුව, එම වාර්තාව සකස් කර අවසන් වූ විගස විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසන බව වැඩිදුරටත් දැනුම් දෙමි. | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. 70,638,545 ක මුදලක් ගෙවා තිබුණද ඉන් නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉදිරියේදී ඔප්පු ලබා දීමට කටයුතු කරන බව දන්වා එවා ඇත. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වැඩසටහන් අංක 02 යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයන්හි සිද්ධීන් 50 කට අදාළව තවදුරටත් අයකර ගැනීමට , කපාහැරීමට හෝ අත්හැරීමට ඇති රු. 27,545,100 ක පාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණය අනුව එම වටිනාකමින් රු.1,334,669 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු.21,626,285 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක පවතින බව නිරීක්ෂණය විය. | විගණන වාර්තාවේ සඳහන් වටිනාකම් නිවැරදිවේ. පෙන්වා දී ඇති පරිදි අදාළ වටිනාකම් තනි තනි වශයෙන් හඳුනාගෙන අදාළ තානාපති කාර්යාල මගින් තොරතුරු කැඳවා මු.රෙ. **106** හා **113** ප්‍රකාරව කටයුතු කිරීමට විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් කටයුතු කලද**,** විදේශ දූත මණ්ඩල වලින් නිවැරදි තොරතුරු සම්පූර්ණ කර එක් රැස් කර ගැනීමේදී ගැටළු රාශියකට මුහුණ දී ඇති බැවින්**,** මෙම කටයුතු නිම කිරීම ප්‍රමාදවෙමින් පවතී. මෙම කටයුතු දක්වා ඇති කාල විශ්ලේෂණය අනුව ප්‍රමුඛතා පදනම මත කඩිනමින් නිම කිරීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට සටහන් කරගන්නා ලදි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ෂීසෙල්ස් හි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල කාර්යාලයේ මහකොමසාරිස් තනතුර 2020 ජනවාරි 15 දින සිට විගණිත දිනය වූ 2021 අප්‍රේල් 08 දින දක්වා පුරප්පාඩුව පැවතුණි. එසේ වූවද නිල නිවාස කුලී වශයෙන් 2020 ජනවාරි සිට 2020 මැයි දක්වා කාලයට අදාළව රු. 3,816,805 ක මුදලක් භාවිතා නොකරන ලද නිල නිවාස වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | සීෂෙල්ස්හි හිටපු ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයාගේ ගිවිසුම්ගත ධූර කාලය අවසන් වීමට පෙර **2020** ජනවාරි මස **14** දින ආපසු සිය රට කැඳවීමට කටයුතු කර ඇත. නැවත මහකොමසාරිස්වරයෙකු කඩිනමින් පත් කරතැයි යන බලාපොරොත්තුව මත සහ නිල නිවස සඳහා වූ ගිවිසුම් කාලය **2020** සැප්තැම්බර් මස **30** දින දක්වා වලංගුව පවතින බැවින්**,** එම නිල නිවසට කුලී ගෙවීමට කටයුතු කර ඇත.<br>එසේ වූවත්**,** මෙම අමාත්‍යාංශය විසින් **2020** අප්‍රේල් **20** දින ලබා දුන් උපදෙස් පරිදි සහ ගිවිසුම්ගත කොන්දේසි වලට අනුව මාසික පෙර දැනුම් දීමක් සහිතව **2020** මැයි මස **01** දින සිට ගිවිසුම අවසන් කිරීමට තානාපති කාර්යාලය කටයුතු කර ඇත.<br>කෙසේ වූවද**, 2020** ජනවාරි **15** දින සිට **2020** මැයි මස **31** දින දක්වා නිල නිවස සඳහා කුලී ලෙස රු. **3,816,805** ක මුදල ගෙවීමට සිදු වී ඇත. | භාවිතා නොකරන ලද නිල නිවාස වෙනුවෙන් නිවාස කුලී වැය නොකළ යුතු වීම. |
| (ආ) | පලස්තීනයේ පිහිටි දූත මණ්ඩල කාර්යාලය, නිල නිවාසය හා පරිවාර නිවාසය පවත්වා ගෙන යාමට එකම ගොඩනැගිල්ලෙහි මහල් නිවාස ඒකක 3 ක් සඳහා | පලස්තීනයේ නිත්‍ය නියෝජිත කාර්යාලය**,** නිත්‍ය නියෝජිත නිල නිවස සහ පරිවාර නිල නිවස යන ත්‍රිත්වයම එකම ගොඩනැගිලි පරිශ්‍රයක් තුල පිහිටා ඇත**.** කුලී ගිවිසුම | රාජ්‍ය මුදල් විචක්ෂණශීලීව වැය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 2017 අගෝස්තු 30 දින සිට 2022 අගෝස්තු 31 දින දක්වා කාලයට අදාළව කල්බදු ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 18 දින සිට මෙම දූත මණ්ඩලයේ එක් නිලධාරියෙකු පමණක් සේවයේ යෙදී සිටින අතර එම දූත මණ්ඩලය විසින් භාවිතා නොකරන ලද පරිශ්‍රයන් වෙනුවෙන් 2019 මැයි සිට 2021 පෙබරවාරි දක්වා ගොඩනැගිලි කුලී වශයෙන් රු. 1,428,887 ක් ද 2019 මැයි සිට 2020 ජනවාරි දක්වා විදුලිය හා ජලය වෙනුවෙන් රු. 45,500 ක් වැයකර තිබුණි. ඒ අනුව එකතුව රු. 1,474,387 ක් භාවිතයට නොගත් පරිශ්‍රයන් වෙනුවෙන් නිශ්කාර්යයව වියදමක් දරා තිබුණි. | අත්සන් කර ඇත්තේ එම මුළු ගොඩනැගිල්ල සඳහාය.<br><br>පලස්තීනයේ පවතින දේශපාලන සහ ආරක්ෂක හේතූන් මත මෙම පරිශ්‍රය දිගටම පවත්වාගෙන යාමට සිදු වූ අතර, එම හේතුවෙන් සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහාම ගිවිසුම් වලට අදාල ගෙවීම කල යුතු මුදල වන රු. 1,474,387.00 ගෙවීමට සිදු වූ බව සඳහන් කරමි. | |

## 3.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1972 වර්ෂයේ මිලට ගත් ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති නිල නිවාස ගොඩනැඟිල්ල 2011 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණි. ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා 2020 | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව 2019 වර්ෂයේදී ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කළ අතර ඒ අනුව ස්වීඩන් ඉංජිනේරු උපදේශන සමාගමක් තෝරා පත්කරගන්නා ලදී. එම උපදේශක සමාගමේ නිර්දේශ තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීමෙන් පසුව, අමාත්‍යාංශ | වත්කම් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී ගොඩනැඟිලි කුලී ලෙස රු. 20,826,523 ක් ගෙවීම් කර තිබුණි. | උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCM) එම පරිශ්‍රයේම නව නිල නිවසක් ඉදිකිරීම දීර්ඝ කාලීන වශයෙන් රජයට වාසිදායක වන බව නිර්දේශ කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | |
| (ආ) | ඕස්ට්‍රේලියාවේ කැන්බරා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ගොඩනැඟිලි 02 ක් 2007 හා 2012 වර්ෂවල සිට භාවිතයෙන් ඉවත්කර තිබුණි.එම ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේදී ගොඩනැඟිලි කුලී ලෙස රු. 6,609,300 ක් ගෙවීම් කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට 2019 වර්ෂයේදී පියවර ගත් අතර ඒ අනුව සුදුසුකම්ලත් ඉංජිනේරු උපදේශන සමාගම් වෙතින් මිල ගණන් කැඳවන ලෙස කැන්බරා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල වෙත උපදෙස් දී ඇත. මේ අතර ගරු විදේශ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශන සේවාවන් සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය වරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | වත්කම් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | 1976 වර්ෂයේ මිලට ගත් කෙන්යාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් නිල නිවස ලෙස භාවිතා කළ ගොඩනැඟිල්ල 2014 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණි. එම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේදී ගොඩනැඟිලි කුලී ලෙස රු. 3,361,960 ක් ගෙවීම් කිරීමට සිදුව තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018 වසරේදී ලබාගෙන ඇති නමුත් යෝජිත ඉදිකිරීම් සැලැස්ම සත්‍ය අවශ්‍යතාවය ඉක්මවා යන බැවින් අනුමත මුදලට ගැලපෙන ආකාරයට සුදුසු නිල නිවසක් ඉදිකිරීම සඳහා නැවත සැලසුම් සකස් කිරීමට තීරණය කර ඇත. තවද පවතින මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන කැන්බරා සහ ස්ටොක්හෝම් හි පිහිටි අදාළ ගොඩනැගිලිවල ප්‍රතිසංස්කරණ හා/හෝ ඉදිකිරීම් මූලික අදියර අවසන් | වත්කම් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කරන තෙක් ඉදිකිරීම් ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට තීරණය කර ඇත. | |
| (ඈ) | විදේශ තානාපති කාර්යාල සඳහා කාර්යය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විදේශ තානාපති කාර්යාල සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීමේදී අදාල කර ගන්නා නිර්නායක මේ වන විට සකස් කර ඇත. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |